# පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය

උඩපළාත ප්‍රාදේශීය සභාව
දැල්පිටිය, අටබාගේ

# පටුන


පිටු අංකය

✓ හැඳින්වීම .......... iii

1- පරිච්ඡේදය - ආයතනික තොරතුරු .......... 1-6

1.1 දැක්ම

1.2 මෙහෙවර

1.3 අරමුණු

1.4 අගයයන්

1.5 සංවිධාන ව්‍යුහය

1.6 බල ප්‍රදේශයේ සිතියම

1.7 කායර්මණ්ඩල තොරතුරු

1.8 උඩපළාත ප්‍රාදේශීය සභාවේ කමිටු

2- පරිච්ඡේදය - පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියක අපේක්ෂාවන් .......... 7-8

2.1 සේවාවන් ලබාදීමේ ප්‍රමිතීන්

2.2 සේවාලාභින්ගේ වගකීම් හා යුතුකම්

3- පරිච්ඡේදය - උඩපළාත ප්‍රාදේශීය සභාවෙන් සලසන සේවාවන් පිළිබඳ තොරතුරු .......... 9-23

3.1 උඩපළාත ප්‍රාදේශීය සභාවෙන් සලසන සේවාවන්

3.2 උඩපළාත ප්‍රාදේශීය සභාවේ සේවාවන් සඳහා නීතිමය ප්‍රතිපාදන

3.3 සේවා සම්බන්ධ තොරතුරු සාරාංශය

4- පරිච්ඡේදය - පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය .......... 24-34

5- පරිච්ඡේදය - සේවාදායක පැමිණිලි යාන්ත්‍රණය .......... 35-36

# හැඳින්වීම

2007 වෂර්යේ ජූලි මස 04 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දී ඇත්තේ රාජ්‍ය ආයතනවල කටයුතු ජනතා සහභාගීත්වයෙන් යුතුව ඉටුකරලීමේ කඩිනම් අවශ්‍යතාවය හේතුවෙනි. එම ජනතා සහභාගීත්වයේදී මනා වගවීමෙන් හා ප්‍රතිචාරාත්මකභාවයෙන් යුතු වූ උසස් තත්ත්වයේ රාජ්‍ය සේවයක් පළාත් පාලන ආයතන තුළ ස්ථාපිත කිරීම අරමුණයි. මෙයින් බල ප්‍රදේශයේ ජනතාව බල ගැන්වීමත් පළාත් පාලන ආයතනය ජනතාවට වගකියන ආයතනයක් බවට පත්කිරීමත් සඳහා දැඩි බලපෑමක් සිදුවනු ඇත.

මෙම පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය උඩපළාත ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කිරීමේදී මෙම බල ප්‍රදේශයේ ජනතාව අපේක්ෂා කරනු ලබන සෑම සේවාවකටම පැවතිය යුතු ප්‍රමිතීන් මොනවාද යන්න නිශ්චිතව සඳහන් කිරීමට බැඳී සිටිමු. ඒ අනුව මෙම ප්‍රඥප්තිය මගින් ආයතනය විසින් සපයන සේවාවන් මොනවාද, එම සේවවාන් සඳහා පවතින පිළිගත් ප්‍රමිතීන් මොනවාද, එම සේවාවන් ලබාගත හැකි ක්‍රම හා ක්‍රියාමාගර් , සේවාවන් වශයෙන් කුමක් අපේක්ෂා කළ හැකිද, එම අපේක්ෂාවන් ඉටු නොවුවොත් ගත යුතු ක්‍රියාමාගර් මොනවාද යනාදිය පිළිබඳ පැහැදිලි අදහසක් සේවාලාභීන්ට ලබාගැනීමට හැකියාව උදාවනු ඇත.

එමෙන්ම පළාත් පාලන ආයතනයෙන් සේවාවන් ලබාගැනීමේදී පළාත් පාලන ආයතනයට තම සහය ලබාදිය යුත්තේ කෙසේද යන්න ද මෙම ප්‍රඥප්තිය තුළින් අවබෝධ කර ගත හැකිවනු ඇත. ඒ අනුව මෙම ප්‍රඥප්තිය තුළ ආයතනයෙන් සලසන සේවාවන්ට අදාළ නෛතික පසුබිම, නීති රීති හා අතුරු ව්‍යවස්ථා ආදියත් ආයතනයේ ව්‍යුහය, කමිටු හා කායර්මණ්ඩල තොරතුරු, ආයතනයේ දැක්ම මෙහෙවර හා අරමුණු හා අගයයන් , ආයතනයේ දිගුකාලීන හා කෙටිකාලීන සැලසුම් මෙන්ම පුරවැසි වගකීම් හා යුතුකම් ද ඇතුළත්ව ඇත.

ඒ අනුව මෙම ප්‍රඥප්තිය වූ කලී, උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට උසස් ප්‍රමිතියෙන් යුතු සේවාවක් ලබාදීම තුළින් තිරසාර සංවධර්නයක් සාක්ෂාත් කර ගැනීම උදෙසා සේවාලාභීන්ගේ සහ පළාත් පාලන ආයතනයේ මහජන නියෝජිතයන් හා කායර්මණ්ඩලය යන දෙපාශර්වය සහයෝගයෙන් හා සාමූහිකත්වයෙන් සිය අයිතිවාසිකම් හා වගකීම් මැනවින් වටහාගෙන ක්‍රියාකිරීමේ පොදු එකඟතාවයක් බව පෙන්වා දෙමු.

# 1- පරිච්ඡේදය
# ආයතනික තොරතුරු

## දැක්ම

පුරවරයට නව ජීවයක්

## මෙහෙවර

මනා සම්පත් කළමනාකරණයෙන් හා ගුණාත්මක සේවාවක් තුළින් , පොදු උපයෝගීතා සේවාවන් හා යටිතල පහසුකම් සපුරාලමින් , ජනතාවගේ සුබවිහරණය හා සුභසාධනය සුරක්ෂිතවන තිරසර සංවර්ධනයක් ස්ථාපිත කිරීම.

## අරමුණු

- කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් සැපයීම
- බල ප්‍රදේශයේ ජනතාවගේ ජනජීවිතය ඉහළ නැංවීම සඳහා යටිතල පහසුකම් ප්‍රවර්ධනය හා පවත්වාගෙන යාම
- පරිසර හානි අවම වන පරිදි සංවර්ධන කටයුතු පවත්වාගෙන යාම
- ප්‍රදේශයේ සියලුම මානව හා භෞතික සම්පත් මනා කළමනාකරණයෙන් යුතුව සංවර්ධන කාර්ය සඳහා ආයෝජනය කිරීම
- ප්‍රදේශයේ පවත්නා සම්පත් උපයෝජනයෙන් හා ආදායම් ප්‍රවර්ධනය සහ ස්වයං උත්පාදන ආදායම් මාගර් හඳුන්වා දීමෙන් ජනතාවගේ ආර්ථිකය නඟා සිටුවීම
- තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම

# අගයයන්


1. වගවීම - බල ප්‍රදේශයේ ජනතාවගේ සුබවිහරණය,පහසුකම් හා සුභසාධනය සාක්ෂාත් කිරීමේ අභිලාෂයෙන් දැක්ම හා අරමුණු තහවුරු කරන පරිපාලන ආයතනයක් වශයෙන් ජනතාවට වගවීම
2. සාමූහිකත්වය- ආයතනික දැක්ම හා අරමුණු අපේක්ෂිත මට්ටම කරා ගෙනයාම උදෙසා කණ්ඩායමක් ලෙස සාමූහිකව එක්වීම
3. අනුකූලතාවය- ප්‍රාදේශීය සභා පනත හා අදාළ වෙනත් අණපනත් නීතිරීති,චක්‍රලේඛ හා රෙගුලාසිවලට අනුගත වෙමින් සුපිලිපන්න හා විනිවිදභාවයෙන් යුතුව කටයුතු කිරිම
4. උපායමාගර්ිකභාවය- බල ප්‍රදේශයේ පවත්නා සියලුම භෞතික හා මානව සම්පත් මනා කළමනාකාරීත්වයෙන් යොදා ගැනීමෙන් ප්‍රදේශයේ සංවධර්නය උදෙසාම ආයෝජනය කිරීම සඳහා නිවැරදිව තීරණ ගැනීම හා ක්‍රියාත්මක වීම
5. ශික්ෂණය- කණ්ඩායමක් ලෙස සියල්ලන්ගේම විනය හා හික්මීම ඉතා උසස් මට්ටමකින් පවත්වා ගැනීම
6. අන්‍යොන්‍ය ගරුත්වය- සේවා දායකයාගේ මෙන්ම සේවාලාභියාගේද ආත්මාභිමානය රැකෙන පරිදි අන්තර් සබඳතා ගොඩනංවා ගැනීම
7. ප්‍රතිචාරාත්මක බව- සහකම්පන සවන්දීම හා මිත්‍රශීලි සුහද සේවාවක් මගින් සේවාලාභියා තෘප්තිමත් කිරීම
8. මානුෂීයත්වය- අපගේ සේවය බල ප්‍රදේශයේ ජනතාවගේ සුභසිද්ධිය උදෙසාය යන්න ඉතා ඉහළින්ම පිළිගනිමින් මානුෂීයත්වයෙන් සේවය කරන ආයතනයක් බවට පත්වීමට කැපවී ක්‍රියාකරන්නෙමු.
9. සවිබල ගැන්වීම- ආයතනයේ සියල්ලන්ම යහපත් කායික මානසික තෘප්තිමත් භාවයකින් හෙබි දැනුම,කුසලතා හා ආකල්පවලින් පිරිපුන් නිලධාරී මණ්ඩලයක් බවට පත්කිරීම

# පළාත ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩල තොරතුරු

| Serial No | Designation | Service | Grade/ class | Salary Code | Service Level | Approv Cadre | Existing cadre as at 2023.04.30 | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | Permants | | | | 25/2014 not permenent | Total | Acting | Casual/ | Contract | Substitive | Temporary | Vacancies | Excess |
| | | | | | | | III | II | I | Sp | | | | | | | | | |
| 1 | Secretary | PPMAS | supra | MN7- 2016 | Tertiary | 1 | | | | 1 | | 1 | | | | | | 0 | |
| 2 | Development Officer | DOS | III/II/I | MN4-2016 | Secondary | 15 | 27 | 3 | 1 | | | 31 | | | | | | 0 | 16 |
| 3 | Technical Officer (Civil) | SLTS | III/II/I | MN3-2016 | Secondary | 4 | 2 | | | | | 2 | | | 2 | | | 2 | |
| 4 | Librarian | SLGLS | III/II/I | MN3-2016 | Secondary | 3 | 1 | | | | | 1 | | | | | | 2 | |
| 5 | Management Assistant | PPMAS | III/II/I | MN2-2016 | Secondary | 14 | 8 | 5 | 1 | | | 14 | | | | | | 0 | |
| 6 | Revenue Inspector | Dept. | III/II/I | MN1-2016 | Secondary | 2 | 1 | 1 | | | | 2 | | | | | | 0 | |
| 7 | Technical Assistant | SLTS | III/II/I | MT1-2016 | Secondary | 1 | | | | | | 0 | | | | | | 1 | |
| 8 | Driver | Dept. | III/II/I/Spl | PL3 - 2016 | Primary | 6 | | | 0 | | | 0 | | | | | | 6 | |
| 9 | Driver (25/2014) *** | Dept. | III/II/I/Spl | PL3 - 2016 | Primary | 1 | 1 | | | | | 1 | | | | | | 0 | |
| 10 | Electrcian | Dept. | III/II/I/Spl | PL2 -2016 | Primary | 1 | | | | | | 0 | | | | | | 1 | |
| 11 | Crematorium Operator | Dept. | III/II/I/Spl | PL2 -2016 | Primary | 1 | | | | | | 0 | | | | | | 1 | |
| 12 | KKS | Dept. | III/II/I/Spl | PL1 -2016 | Primary | 2 | 1 | 0 | | | | 1 | | | | | | 1 | |
| 13 | Watcher | Dept. | III/II/I/Spl | PL1 -2016 | Primary | 4 | 3 | | | | | 3 | | | | | | 1 | |
| 14 | Library Attendant | Dept. | III/II/I/Spl | PL1 -2016 | Primary | 4 | 4 | | | | | 4 | | 2 | | | | 0 | 2 |
| 15 | Library Attendant (25/2014) *** | Dept. | III/II/I/Spl | PL1 -2016 | Primary | 2 | 2 | | | | | 2 | | | | | | 0 | |
| 16 | Water Pump Caretaker | Dept. | III/II/I/Spl | PL1 -2016 | Primary | 1 | 0 | | | | | 0 | | | | | | 1 | |
| 17 | Crematorium Op: Asst. | Dept. | III/II/I/Spl | PL1 -2016 | Primary | 1 | 0 | | | | | 0 | | | | | | 1 | |
| 18 | Crematorium Op: Asst. (25/2014) *** | Dept. | III/II/I/Spl | PL1 -2016 | Primary | 1 | 0 | | | | | 0 | | | | | | 1 | |
| 19 | Water Labourer | Dept. | III/II/I/Spl | PL1 -2016 | Primary | 2 | 2 | | | | | 2 | | 5 | | | | 0 | 5 |
| 20 | Work/Field Labourer | Dept. | III/II/I/Spl | PL1 -2016 | Primary | 19 | 12 | 1 | | | | 13 | | 4 | | | | 6 | |
| 21 | Health Labourer | Dept. | III/II/I/Spl | PL1 -2016 | Primary | 19 | 8 | 3 | | | | 11 | | 1 | | | | 8 | |
| 22 | Health Labourer (25/2014) *** | Dept. | III/II/I/Spl | PL1 -2016 | Primary | 1 | 1 | | | | | 1 | | | | | | 0 | |
| | Total | | | | | 105 | 73 | 13 | 2 | 1 | | 89 | | 12 | 2 | | | 32 | 23 |

**පුස්තකාල සහායක අතිරික්ත ලෙස පෙන්වන සහායිකාවන් දෙදෙනා 2023.08.20 වන දින දක්වා පමණක් සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලැබී ඇත.
**ජල කම්කරුවන් අතිරික්ත ලෙස පෙන්වන කම්කරුවන් 5 දෙනා පුරනැගුම ජල ව්‍යාපෘතිය සඳහා බඳවා ගෙන ඇත.
** මාගර් කම්කරුවන් 4 දෙනා සහ සෞඛ්‍ය කම්කරුවන් 5 දෙනා 2023.07.05 වන දින දක්වා දෛනික වැටුප් මත සේවයේ යොදවා ගැනීමට අනුමත වී ඇත.

# උඩපළාත ප්‍රාදේශීය සභාවේ සංවිධාන ව්‍යූහය



## උඩපළාත ප්‍රාදේශීය සභාවේ ස්ථාවර කමිටු හා උපදේශන කමිටු

1. මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව
2. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව
3. තාක්ෂණික සේවා කමිටුව
4. පරිසර හා පහසුකම් කමිටුව
5. උපදේශක කාරක සභාව
6. පුස්තකාල උපදේශක කමිටු

# 2 පරිච්ඡේදය - පුරවැසි ප්‍රඥප්තිය සකස් කිරීමේ අපේක්ෂාවන්

සේවාලාභීන්ට කිසියම් ආයතනයකින් අපේක්ෂා කරන සේවා අවශ්‍යතා අදාළ ප්‍රමිතීන්ට අනුකූලව ලබාගැනීමට ඇති අයිතිය පිළිගනු ලබන ලිඛිත බැඳීමක් පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය යනුවෙන් අර්ථ දැක්වේ.

ඒ අනුව යමින් උඩපළාත ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට තිරසාර සංවර්ධනයක් උදාකිරීමේ පුරෝගාමී ආයතනය වශයෙන් පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය තුළින් අපේක්ෂා කරනුයේ සේවාලාභීන්ගේ අවශ්‍යතාවයන් සඳහා කඩිනම්,කාර්යක්ෂම, ගුණාත්මක හා අඛණ්ඩ සේවයක් ලබාදෙන බවට ලිඛිතව බැඳී සිටීමයි. ඒ අනුව මෙම ආයතනයේ සේවාවන් ඉටුකිරීමේදී ප්‍රකාශ කර ඇති තත්ත්වයන්ට හා ප්‍රමිතීන්ට අනුව ඉටුකරනු ලබන බවට සහතික වීමත් යම්කිසි සේවාවක් ඉටුකිරීමට ගතවන උපරිම කාලය දැක්වීමත් මෙමගින් පැහැදිලි කර ඇත. මෙම ප්‍රඥප්තිය මගින් පහත කරුණු ඉටුකර ගැනීම අපේක්ෂා කරයි.

I. සේවා ප්‍රමිතී යම කිරීම (මහජන සේවා අවශ්‍යතා හා ආයතනය සතු ධාරිතාවය සැළකිල්ලට ගනිමින්)

II. මහජනතාවට නිවැරදි කරුණු හා තොරතුරු විවෘතව සැපයීමට සහතික වීම

III. මහජන සහභාගිත්වය හා උපෙද්ශනය

IV. සේවාවන් ලබා ගැනීමට හා ප්‍රයෝජනයට ගැනීමට මහජනතාව උනන්දු කිරිම හා විවිධ සේවාවන් සපයන මාධ්‍යයන් ප්‍රචලිත කිරිම

V. සියල්ලන්ට ආචාරශීලීව, මිත්‍රශීලිව හා සාධාරණව සැලකීම

VI. වරදක් සිදු වූ විට නිවැරදි කිරිම

VII. ඵලදායී ලෙස සම්පත් භාවිතා කිරීම

VIII. නිමර්ාණශීලිත්වය සඳහා අවකාශ සැලසීම

IX. සේවා සැපයීමේදි සම්බන්ධවන අනෙකුත්සේවා සපයන ආයතන සමඟ සහෙයෝගිතාවෙයන් කටයුතු කිරිම

X. පිළිගත හැකි බව - උදා. කායර් සාධනයේ ස්ථායිතාවය

XI. ප්‍රතිචාර දැක්වීම - උදා. නියමිත වේලාවට සේවාවන් සැපයීම

XII. විශ්වාසනීයත්වය - උදා. සේවාලාභීන්ගේ අවශ්‍යතාවයට මූලිකත්වය දීම

XIII. දයාන්විත බව - උදා. අවශ්‍යතාවයට නිසි අවධානය යොමු කිරීම

XIV. ආචාරශීලී බව, සැලකිල්ල හා සේවා සැපයීමට සූදානම - උදා. සේවය සැපයීමට කැමැත්ත සහ සූදානම් බව හැඟවීම

## 2.1 සේවාවන් ලබාදීමේ ප්‍රමිතීන්

- සුහදශීලී පිළිගැනීම
- නිවැරදි හා පැහැදිලි තොරතුරු සම්පාදනය
- ආචාරශීලී ප්‍රතිචාර දැක්වීම
- සේවාලාභී ඔබ වෙනුවෙන් පහසුකම් සැලසීම
- සේවාලාභීයාගේ භාෂා මාධ්‍යයන් සේවා සැපයීමට පහසුකම් සැලසීම
- අපක්ෂපාතී වීම.

## 2.2 සේවාලාභීන්ගේ වගකීම් හා යුතුකම්

- ආයතනයේ ක්‍රියාකාරීත්වය සහ නීතිමය තත්ත්වයන් පිළිබඳව නිවැරදි දැනුම ලබාගැනීම.
- බදු මුදල් නියමිත දිනට ගෙවීමෙන් ප්‍රදේශයේ සංවධර්නයට සහයවීම.
- පරිසරයට කැලිකසළ බැහැර නොකිරීම.
- ජල මූලාශ්‍ර ආරක්ෂා කරගැනීමට කටයුතු කිරීම.
- නීතිගරුක පුරවැසියකුවීම.
- ලබාදී ඇති යටිතල පහසුකම් හා සෙසු සම්පත් ආරක්ෂා කරමින් පරිහරණය කිරීමට කටයුතු කිරීම.

# 3 පරිච්ඡේදය -

# උඩපළාත ප්‍රාදේශීය සභාවෙන් සලසන සේවාවන් පිළිබඳ තොරතුරු

## 3.1 උඩපළාත ප්‍රාදේශීය සභාවෙන් සලසන සේවාවන්

| අනු අංකය | සේවාවන් |
|---|---|
| 01. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම |
| 02. | ඉඩම් අනු බෙදුම් හා ඒකාබද්ධ කිරීමේ සංවධර්න සැලසුම් අනුමත කිරීම |
| 03. | සංවධර්න බලපත්‍රයක වලංගු කාලය දීඝර් කිරීම |
| 04. | අනවසර ඉදිකිරීම් සඳහා ආවරණ අනුමතය දීම |
| 05. | අනුකූලතා සහතිකය නිකුත් කිරීම |
| 06. | වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීම |
| 07. | නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම |
| 08. | වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම |
| 09. | ව්‍යාපාර බද්ද අය කර ගැනීම |
| 10. | කමර්ාන්ත බද්ද අය කර ගැනීම |
| 11. | පරිසර ආරක්ෂණ බලපත්‍රය |
| 12. | ප්‍රචාරක දැන්වීම් ප්‍රදශර්න අවසර පත්‍ර නිකුත් කිරීම |
| 13. | වරිපනම් අය කිරීම |
| 14. | ආදාහනාගාරය වෙන් කරවා ගැනීම |
| 15. | මාගර් පළුදු කිරීමට අවසර ඉල්ලීම |
| 16. | ගස්වලින් සිදු වන අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීම |
| 17. | විනෝද බද්ද අය කර ගැනීම සහ විනෝද බද්දෙන් නිදහස් කිරීම |
| 18. | උත්සව ශාලා / නගර ශාලා / ප්‍රජා ශාලා කුලියට දීම |
| 19. | ක්‍රීඩා පිටි කුලියට දීම |
| 20. | ජල බවුසර් සේවාව ලබා දීම |
| 21. | දේපළ හිමිකම ලියා පදිංචි කිරීම හා සංශෝධනය කිරීම |
| 22. | ඇතැම් ඉඩම් විකිණීම මත බදු |
| 23. | ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි බලපත්‍ර නිකුත් කිරීම |
| 24. | නිවාස නොවන ස්ථානවල කසළ ඉවත් කිරීම |
| 25 | අක්කර බදු අය කිරීම |
| 26. | ජල සබඳතා ලබාදීම |
| 27 | පුස්තකාල සේවාව |
| 28 | ර් නැණ පියස සේවය |

## 3.2 උඩපළාත ප්‍රාදේශීය සභාවේ සේවාවන් සඳහා නීතිමය ප්‍රතිපාදන

- ප්‍රාදේශීය සභා පනත
- වෙනත් අණ පනත්
- චක්‍රලේඛණ

| උඩපළාත ප්‍රාදේශීය සභාවේ බලතල | | |
|---|---|---|
| අනු අංකය | පනත් අංකය/අධිකාරය | පනත |
| **01** | 262 අධිකාරය | පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනත |
| 02 | 1861 අංක 10(193 වැනි අධිකාරය) | මහා මාගර් ආඥා පනත |
| 03 | 1901 අංක 25( 477 වැනිඅධිකාරය) | බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥා පනත |
| 04 | 1912 අංක 07 (176 වැනිඅධිකාරය) | ප්‍රසිද්ධ රැඟුම් ආඥා පනත |
| 05 | 1915 අංක 19 (268 වැනිඅධිකාරය) | නිවාස හා නගර සංවධර්න ආඥා පනත |
| 06 | 1916 අංක 04 (202 වැනිඅධිකාරය) | වාහන ආඥා පනත |
| 07 | 1935 අංක 19(464 වැනි අධිකාරය) | ඉඩම් සංවධර්න ආඥා පනත |
| 08 | 1939අංක 32(140 වැනි අධිකාරය) | මාතෘ සුභසාධක ආඥා පනත |
| 09 | 1946 අංක 12 (267 වැනිඅධිකාරය) | විනෝද බදු ආඥා පනත |
| 10 | 1946 අංක 13 (269 වැනිඅධිකාරය) | නගර හා ග්‍රාම නිමර්ාණ ආඥා පනත |
| 11 | 1946 අංක 30 (266 වැනිඅධිකාරය) | බදු තක්සේරු සහ වරිපණම් බදු පැනවීමේ ආඥා පනත |
| 12 | 1950 අංක 19 (205 වැනිඅධිකාරය) | ඉඩම් අත්පත් කර ගැනීමේ පනත |
| 13 | 1951 අංක 12 (275 වැනිඅධිකාරය) | තානායම් පනත |
| 14 | 1951 අංක 25 (450 වැනිඅධිකාරය) | පස සංරක්ෂණ පනත |
| 15 | 1952අංක 06 (261 වැනි අධිකාරය) | පළාත් පාලන ආයතන (ආදශර් අතුරු ව්‍යවස්ථා) ආඥාපනත |
| 16 | 1964 අංක 14 | පළාත් පාලන ආයතන නිවාස පනත |
| 17 | 1970 අංක 33 | පළාත් පාලන අමාත්‍ය (බලතල පැවරීමේ) පනත |
| 18 | 1972 අංක 12 | ගෙවල් කුලී පනත |
| 19 | 1975 අංක 17 | සමාජශාලා බලපත් නිකුත් කිරීමේ පනත |
| 20 | 1978 අංක 41 | නාගරික සංවධර්න අධිකාරි පනත |
| 21 | 1978 අංක 42 | පළාත් පාලන ආයතන නිල නිවාස (අයිතියලබාගැනීමේපනත |
| 22 | 1980 අංක 26 | ආහාර පනත |
| 23 | 1980 අංක 47 | මධ්‍යම පරිසර අධිකාරි පනත |
| 24 | 1981 අංක 73 | මහා මාගර් සංවධර්න පනත |
| 25 | 1987 අංක 12 | පළාත් සභා(අනුශාංගික විධිවිධාන )පනත |
| 26 | 1987 අංක 42 | පළාත් සභා පනත |
| 27 | 1988 අංක 56 | ජාතික පරිසර අධිකාරි පනත |
| 28 | 2012 අංක 21 | පළාත් පාලන ආයතන(විශේෂ විධිවිධාන )පනත |
| 29 | 2012 අංක 22 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ (සංශෝධන )පනත |
| 30 | 1946 අංක 30 | වරිපණම් හා තක්සේරුකරණ ආඥා පනත |
| 31 | 1889 අංක 15 | වෙන්දේසිකරුවන් හා තැරැව්කරුවන් පිළිබඳ ආඥාපනත |
| 32 | 1893 අංක 19 | ගොසාතක ආඥා පනත |
| 33 | 1899 අංක 09 | සුසානභූමි ආඥා පනත |
| 34 | 1907 අංක 01 | නොතාරිස් ආඥා පනත |
| 35 | 1935 අංක 47 | වීථි සම්මාදම් විධිමත් කිරීමේ ආඥා පනත |
| 36 | 1975 අංක 17 | සමාජශාලා සඳහා බලපත ලබාදීමේ නීතිය |
| 37 | 1982 අංක 42 | මුද්දර ගාස්තු පනත |
| 38 | 1887 අංක 06 | ඛනිජ තෙල් ආඥා පනත |
| 39 | 2005 අංක 12 | සුසානභූමි හා භූමදාන ඉඩම් පිළිබඳ ආඥා පනත |

| | | |
|---|---|---|
| **40** | 1946 අංක 57 | පීඩක ක්‍රියා ආඥා පනත |
| 41 | 1998 අංක 62 | විනෝද බදු ආඥා පනත |
| 42 | 2000 අංක 01 | ගස් හෙළීම (පාලනය කිරීමේ)පනත |
| 43 | 1969 අංක 11 | ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි පිළිබඳ ආඥා පනත |

## උඩපළාත ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක අතුරු ව්‍යවස්ථා

| I | වැළඳගෙන ඇති අතුරු ව්‍යවස්ථා | | |
|---|---|---|---|
| අනු අංකය | අතුරු ව්‍යවස්ථාවේ නම | අතුරු ව්‍යවස්ථාවේ අංකය(ගැසට් අංකය) | වැළඳගත් දිනය |
| 1 | ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | 2068 | 2018.04.20 |
| 2 | සේවා සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | 2068 | 2018.04.20 |

I I පනවාගෙන ඇති අතුරු ව්‍යවස්ථා

| අනු අංකය | අතුරු ව්‍යවස්ථාවේ නම | අතුරු ව්‍යවස්වේ අංකය | වැළඳගත් දිනය |
|---|---|---|---|
| 1 | කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | 1774 | 2012.08.30 |
| 2 | ආදාහනාගාර කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | 1774 | 2012.08.30 |
| 3 | පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | 1923/7 | 2015.07.13 |
| 4 | සංචාරක වෙළඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | 1923/7 | 2015.07.13 |
| 5 | දැන්වීම් පුවරු සම්බන්ධයෙන් වන අතුරු ව්‍යවස්ථාව | 1923/7 | 2015.07.13 |
| 6 | ගෝ ඝාතනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | 1923/7 | 2015.07.13 |
| 7 | මස් වෙළඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | 1923/7 | 2015.07.13 |
| 8 | මාළු වෙළඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | 1923/7 | 2015.07.13 |
| 9 | උත්සව උපකරණ හා භාණ්ඩ සැපයීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | 1923/7 | 2015.07.13 |
| 10 | මහජන පුස්තකාල පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | 1923/7 | 2015.07.13 |
| 11 | බදු අයකර ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | 1923/7 | 2015.07.13 |
| 12 | සත්ව ගොවිපළවල් පාලනය කිරීම හා විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | 1923/7 | 2015.07.13 |

## 3.3 සේවා සම්බන්ධ තොරතුරු සාරාංශය

| අ අ | ලබාදෙන සේවය | සපුරාලිය යුතු අවශ්‍යතා | අදාල නීති රීති, රෙගුලාසි | ලබාදෙන සහන හෝ පැහැර හැරීමේදී දණ්ඩනය |
|---|---|---|---|---|

| අ අ | ලබාදෙන සේවය | සපුරාලිය යුතු අවශ්‍යතා | අදාල නීති රීති, රෙගුලාසි | ලබාදෙන සහන හෝ පැහැර හැරීමේදී දණ්ඩනය | |
|---|---|---|---|---|---|
| | | | | ලබාදෙන සහන් | දණ්ඩනය |
| 1 | ගොඩනැගිලි අයදුම්පත් අනුමත කිරීම | (අ) අනුමතය ලබා දෙන පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශය තුළපවතින ඉඩමක් විය යුතුයි.<br><br>(ආ) අයදුම්කරු දේපළෙහි නීත්‍යානුකූල හිමිකරු විය යුතු ය. නැතහොත් ඔහුගෙන් බලය ලබා ගත් නියෝජිතයකු විය යුතු ය.<br><br>(ඇ) පළාත් පාලන ආයතනය විසින් (වරිපනම් අය කිරීමේ කලාපයක් තුළ පවතින ඉඩමක් වන විට) පවත්වාගෙන යනු ලබන තක්සේරු ලේඛනයෙහි අදාළ දේපළෙහි නීත්‍යානුකූල අයිතිය ඇති තැනැත්තාගේ නම ඇතුළත් වී තිබිය යුතු ය. (තක්සේරු ලේඛනයේ නම ඇතුළත් කර ගැනීම සඳහා දේපළ හිමිකම ලියා පදිංචි කර ගැනීමේ පටිපාටිය බලන්න)<br><br>(ඈ) (i) නිවාස හා නගර සංවර්ධන ආඥාපනත අදාළ වන ප්‍රදේශයක් ඇතුළත කෙරෙන ඉදිකිරීමක් වන විට, නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ උප ලේඛනයේ දැක්වෙන රීති අනුව ඉදිකිරීම් සැලැස්ම ඇඳ තිබිය යුතු ය.<br><br>(ii) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත කෙරෙන ඉදිකිරීමක් වන විට, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ සාදන ලද 2021 නාගරික සංවර්ධන අධිකාරියේසැලසුම් හා සංවර්ධන නියෝගවල දක්වා ඇති නියම අනුව අඳින ලද ඉදිකිරීම් සැලැස්මක් තිබිය යුතු අතර, අදාළ ඉඩමේ පිඹුර ඒ නියෝගවලට අනුව | (අ) 268 අධිකාරය වන නිවාස හා නගර සංවර්ධන ආඥාපනත;<br><br>(ආ) නිවාස හා නගර සංවර්ධන ආඥාපනත යටතේ සාදන ලද රීති;<br><br>(ඇ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත;<br><br>(ඈ) නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ සාදන ලද අංක: 2235/54 හා 2021. 07. 08 දින අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග | - | බලපත්‍රයක් ලබා නොගෙන කරන ලද ඉදිකිරීමක් හෝ නිකුත් කළ බලපත්‍රයේ කොන්දේසිවලට පටහැණි ව සිදු කරන ලද සෑම ඉදිකිරීමක් ම අනවසර ඉදිකිරීමක් ලෙස අර්ථ නිරූපණය ඇත. මෙවැනි සෑම අනවසර ඉදිකිරීමක් ම කඩා ඉවත් කරන ලෙස නාගරික කොමසාරිස් / සභාපතිවරයා විසින් නියෝග නිකුත් කරනු ඇත. එම නියෝගයට අනුගත නොවන සෑම අවස්ථාවකම, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 28අ වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනු ඇත. මහේස්ත්‍රාත්වරයා විසින් අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීමට නියෝගය ලබා දෙනු ඇත. |

| අ අ | ලබාදෙන සේවය | සපුරාලිය යුතු අවශ්‍යතා | අදාල නීති රීති, රෙගුලාසි | ලබාදෙන සහන හෝ පැහැර හැරීමේදී දණ්ඩනය | |
|---|---|---|---|---|---|
| | | අනුමත කර තිබිය යුතු ය. | | | |
| 2 | ඉඩම් අනු බෙදුම් හා ඒකාබද්ධ කිරීමේ සංවර්ධන සැලසුම් අනුමත කිරීම | (අ) පළාත් පාලන ආයතනයේ සීමාව තුළ, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ප්‍රදේශයක පවතින ඉඩමක් විය යුතුයි.<br>(ආ) අයදුම්කරු දේපළෙහි නීත්‍යානුකූල හිමිකරු විය යුතු ය. නැතහොත් ඔහුගෙන් බලය ලබා ගත් නියෝජිතයකු විය යුතු ය.<br>(ඇ) පළාත් පාලන ආයතනය විසින් වරිපනම් අය කිරීමේකලාපයක්තුළ ඉඩම පවතින්නේ නම්, අදාළ දේපළෙහි නීත්‍යානුකූල අයිතිය ඇති තැනැත්තාගේ නම තක්සේරු ලේඛනයෙහි ඇතුළත් වී තිබිය යුතු ය. (තක්සේරු ලේඛනයේ නම ඇතුළත් කර ගැනීම සඳහා දේපළ හිමිකම ලියා පදිංචි කර ගැනීමේ පටිපාටිය බලන්න)<br>(ඈ) ඉඩමේ පිඹුර, 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග මගින් කරන ලද නියමවලට අනුව අඳින ලද එකක් විය යුතු ය | • 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ සාදන ලදුව අංක 2235/54 හා 2021. 07. 08 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග. | | කොන්දේසි ප්‍රකාරව අනුබෙදුම් කළ යුතු අතර පහත අණපනත් පරිදි ගරු අධිකරණයේ නඩු පවරා ඒ අනුව ක්‍රියා කළ හැකිය<br>1. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>2. 1982 අංක 4 දරන නා.සං.අධිකාරි පනත<br>3. නිවාස හා නගර සංවර්ධන ආඥා පනත<br>ග්‍රාම නිමර්ාණ ආඥා පනත |
| 3 | සංවර්ධන බලපත්‍රයක වලංගු කාලය | පළාත් පාලන ආයතනයෙන් නිකුත් කළ සංවර්ධන | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8ඒ | | • සෑම අනවසර ඉදිකිරීමක් ම කඩා ඉවත් කරන ලෙස සභාපතිවරයා |

| අ අ | ලබාදෙන සේවය | සපුරාලිය යුතු අවශ්‍යතා | අදාල නීති රීති, රෙගුලාසි | ලබාදෙන සහන හෝ පැහැර හැරීමේදී දණ්ඩනය | |
|---|---|---|---|---|---|
| | දීඝර් කිරීම | බලපත්‍රයේ වලංගු කාලය ඉක්මයාමට ආසන්න ව තිබීම සහ සංවර්ධන බලපත්‍රය නිකුත් කළ දින සිට වසර තුනක කාලයක් ඉකුත් ව නොතිබීම. | වගන්තිය සමග කියවිය යුතු, 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල3 වන සහ 30 වන නියෝග. | | විසින් නියෝග නිකුත් කරනු ඇත. එම නියෝගයට අනුගත නොවන සෑම අවස්ථාවකම, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 28අ වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනු ඇත. මහේස්ත්‍රාත්වරයා විසින් අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීමට නියෝගය ලබා දෙනු ඇත. |
| 4 | අනවසර ඉදිකිරීම් සඳහා ආවරණ අනුමතය දීම | (අ) අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පවතින ඉඩමක් විය යුතුයි.<br>(ආ) අයදුම්කරු දේපළෙහි නීත්‍යානුකූල හිමිකරු විය යුතු ය. නැතහොත් ඔහුගෙන් බලය ලබා ගත් නියෝජිතයකු විය යුතු ය.<br>(ඇ) පළාත් පාලන ආයතනය විසින් වරිපනම් අය කිරීමේ කලාපයක් තුළ ඉඩම පවතින්නේ නම්, අදාළ දේපළෙහි නීත්‍යානුකූල අයිතිය ඇති තැනැත්තාගේ නම තක්සේරු ලේඛනයෙහි ඇතුළත් වී තිබිය යුතු ය. (තක්සේරු ලේඛනයේ නම ඇතුළත් කර ගැනීම සඳහා දේපළ හිමිකම ලියා පදිංචි කර ගැනීමේ පටිපාටිය බලන්න)<br>(ඈ) (i) නිවාස හා නගර සංවර්ධන ආඥාපනත අදාළ වන ප්‍රදේශයක් ඇතුළත කෙරෙන ඉදිකිරීමක් වන විට, නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ උප ලේඛනයේ දැක්වෙන රීති අනුව ඉදිකිරීම් සිදු කර තිබිය යුතු ය, නැතහොත් ඒ රීතිවලට අනුව අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව සැලැස්ම ඇඳ තිබිය යුතු ය.<br>(ii) නාගරික සංවර්ධන | (අ) 268 වන අධිකාරය වූ නිවාස හා නගර සංවර්ධන ආඥාපනත.<br>(ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත.<br>(ඇ) නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ සාදන ලද අංක: 2235/54 හා 2021. 07. 08 දින අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග. | | • සෑම අනවසර ඉදිකිරීමක් ම කඩා ඉවත් කරන ලෙස සභාපතිවරයා විසින් නියෝග නිකුත් කරනු ඇත. එම නියෝගයට අනුගත නොවන සෑම අවස්ථාවක ම, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 28අ වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනු ඇත. මහේස්ත්‍රාත්වරයා විසින් අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීමට නියෝගය ලබා දෙනු ඇත. |

| අ අ | ලබාදෙන සේවය | සපුරාලිය යුතු අවශ්‍යතා | අදාල නීති රීති, රෙගුලාසි | ලබාදෙන සහන හෝ පැහැර හැරීමේදී දණ්ඩනය | |
|---|---|---|---|---|---|
| | | ප්‍රදේශයක් ඇතුළත කෙරෙන ඉදිකිරීමක් වන විට, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ සාදන ලද 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවල දක්වා ඇති නියම අනුව ඉදිකිරීම් සිදු කර තිබිය යුතු ය, නැතහොත් ඒ රීතිවලට අනුව අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව සැලැස්ම ඇඳ තිබීම සහ ඒ අනුව ඉදිකිරීම් කර තිබීම හෝ ඊට සරිලන ආකාරයෙන් ඉදිකිරීම් වෙනස් කර හෝ අනුමත කිරීමට සුදුසු නොවන කොටස් ඉවත් කර තිබිය යුතු ය. අදාළ ඉඩමේ පිඹුර ඒ නියෝගවලට අනුව අනුමත කර තිබිය යුතු ය. | | | |
| 5 | අනුකූලතා සහතිකය නිකුත් කිරීම | නිකුත් කළ සංවර්ධන බලපත්‍රය හා අනුමත ගොඩනැගිලි සැලැස්ම අනුව අදාළ ඉදිකිරීම් සිදු කර පැවතීම | (අ) 268 වන අධිකාරය වූ නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ 15 වන වගන්තිය.<br>(ආ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8ඒ වගන්තිය සමග කියවිය යුතු, 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝගවලVI වන කොටස. | | සංවර්ධන බලපත්‍රයක් යටතේ කරන ලද යම් සංවර්ධන කාර්යක් භාවිත කිරීමට පෙර, නිකුත් කළ බලපත්‍රය යටතේ අදාළ සංවර්ධනය සිදු කර ඇති බවට අනුකූලතා සහතිකයක් ලබා නො ගෙන ඒ සංවර්ධන කටයුත්ත ප්‍රයෝජනයට ගැනීම නො කළ යුතු ය. එවැනි අවස්ථාවක දී, එය භාවිතයට ගැනීම අනවසර භාවිතයට ගැනීමක් සේ සලකා ක්‍රියා කරනු ලැබේ. මේ භාවිතයට එරෙහිව අධිකරණ ක්‍රියා මාගර්වලට යටත් වීමට සිදු වේ |
| 6 | වීථි රේඛා / ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීම | 1. ඉඩම/දේපළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්වීම | (අ) වීථි රේඛාව:<br>i.252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 69 වන වගන්තිය.<br>ii. 268 අධිකාරය වන නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තිය සහ ඒ යටතේ සාදන ලද රීතිවල 8 වන රීතිය.<br>(ආ) ගොඩනැගිලි | | • සභාවේ අනුමැතියෙන් තොරව සිදුකරන ඉදිකිරීම් ඉවත් කර ගාස්තු අයකිරීම- ප්‍රාදේශීය සභා පනතේ 47 හා 59 වගන්ති<br>• සභාවේ අවසරයකින් තොරව ගොඩනැගිලි සීමාව තුළ කර ඇති ඉදිකිරීම ඉවත් කිරීම- ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය |

| අ අ | ලබාදෙන සේවය | සපුරාලිය යුතු අවශ්‍යතා | අදාල නීති රීති, රෙගුලාසි | ලබාදෙන සහන හෝ පැහැර හැරීමේදී දණ්ඩනය | |
|---|---|---|---|---|---|
| | | | සීමාව:<br><br>i. 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 74 (1) (අ);ii. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 49 වන වගන්තිය.<br><br>iii. 1978 අංක 41 දරන නාගරික සංවධර්න අධිකාරිය පනත යටතේ, යම් නාගරික සංවධර්න ප්‍රදේශයක් සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කර ප්‍රකාශයට පත් කර ඇති සංවධර්න සැලැස්මෙහි නියම කර ඇති සීමාව;<br>iv. මාගර් සංවධර්න අධිකාරියට අයත් මාගර් සම්බන්ධයෙන් ඒ අධිකාරය විසින් නියම කර ප්‍රකාශයට පත් කර ඇති ගොඩනැගිලි සීමාව;<br><br>v. කිසියම් පළාත් බද මාගර් සංවධර්න අධිකාරියකට අයත් මාගර් සම්බන්ධයෙන් ඒ අධිකාරය විසින් නියම කර ප්‍රකාශයට පත් කර ඇති ගොඩනැගිලි සීමාව. | | |
| 7 | නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම | (අ) තක්සේරු ලේඛනයේ අදාළ දේපළෙහි නීත්‍යානුකූල අයිතිකරු ලෙස නම සඳහන් වී ඇති තැනැත්තා මෙම විස්තර ඉල්ලා සිටීමට හිමිකම් ලබනු ඇත.<br><br>(ආ) දේපළෙහි නීත්‍යානුකූල අයිතිකරු නොවන යම් තැනැත්තකු විසින් මෙම විස්තර ඉල්ලා සිටින්නේ නම්,නීත්‍යානුකූල අයිතිකරු විසින් ඒ සඳහා ලියවිල්ලකින්ඔහුට බලය පවරා තිබිය යුතු ය. | (අ) 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 252, 253, 255, 256, 257 සහ 259 වන වගන්ති;<br>(ආ) 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 166 වන වගන්තිය සමග කියවිය යුතු මහා නගර සභා ආඥාපනතේ 252, 253, 255, 256, 257 සහ 259 වන වගන්ති;<br><br>(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158, 159, 161, 162, 163, | - | - |

| අ අ | ලබාදෙන සේවය | සපුරාලිය යුතු අවශ්‍යතා | අදාල නීති රීති, රෙගුලාසි | ලබාදෙන සහන හෝ පැහැර හැරීමේදී දණ්ඩනය | |
|---|---|---|---|---|---|
| | | (ඇ) සහතිකය ඉල්ලුම් කරන දින වන විට සභාවට අය විය යුතු සියලු ම මුදල් ගෙවා අවසන් කර තිබිය යුතු ය. | 164, 165 සහ 166 වගන්ති. | | |
| 8 | වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම | (අ) යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ, සභාවෙන් බලපත්‍රයක් ලබා ගත යුතු වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් විය යුතු ය.<br>(ආ) ජාතික පාරිසරික පනත යටතේ සාදන ලද නියෝග අනුව පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු කාර්යයක් වන අවස්ථාවක, වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රයක් තිබිය යුතු ය. (1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23ව වගන්තිය) | • 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වනවගන්තිය * යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා හෝ ඒ යටතේ සාදන ලදැයි සලකනු ලබනහා සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා.<br>• ප්‍රාදේශීය සභා පනතේ149 * වන වගන්තිය<br>• ප්‍රාදේශීය සභා පනතේ 167 * වන වගන්තිය<br>• වෙළෙඳ බලපත්‍රය අදාළ වන කමර්ාන්තය, පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු කමර්ාන්තයක් වන විට 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23ව වගන්තිය | | • නියමය අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති විට, මහේස්ත්‍රාත් ඉදිරියේ චෝදනා පත්‍රය ගොනු කිරීම<br>• වරදට වරදකරු කර දඩ නියම කිරීම<br>• වෙළෙඳ බලපත්‍රය ලබා ගන්නා ලෙස නැවත නියම කිරීම<br>• දෙවන වරට කරන ලද නියමය අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති විට, මහේස්ත්‍රාත් ඉදිරියේ දෙවන වරට චෝදනා පත්‍රය ගොනු කිරීම<br>• දෙවන වරට වරදට වරදකරු කිරීම සහ රු. 750.00 ක දඩයක් සහ පළමු අධිකරණ තීන්දු ප්‍රකාශයේ දින සිට දෙවන තීන්දු ප්‍රකාශය දක්වා දිනකට රු. 250.00 බැගින් වූ අතිරේක දඩයක් නියම කිරීම<br>• වෙළෙඳ බලපත්‍රය ලබා ගන්නා ලෙස අවසන් වතාවට නියම කිරීම<br>• මහේස්ත්‍රාත්වරයාගෙන් සමාප්ති ආඥාව ඉල්ලා සිටීම<br>• සමාප්ති ආඥාව නිකුත් කිරීම<br>• අදාළ වෙළෙඳාම / ව්‍යාපාර ස්ථානය මුද්‍රා තැබීම |
| 9 | ව්‍යාපාර බද්ද අය කර ගැනීම | කමර්ාන්ත බද්දට යටත් ස්ථානයක් නොවන ස්ථානයක් වන අවස්ථාවක සහ අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට නියම කර නොමැති හා සේවා සැපයීමේ කාර්යක නියුක්ත වන තැනැත්තකු මේ බද්ද | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ (1) ඡේදය | | • සිහි කැඳවීමට අනුගත වී නොමැති විට, බද්ද අය කර ගැනීමට මහේස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් ගොනු කිරීම<br>• අය කර ගත යුතු බද්ද දඩයක් වශයෙන් අය කර ගැනීමට නියෝගය නිකුත් කිරීම |

| අ අ | ලබාදෙන සේවය | සපුරාලිය යුතු අවශ්‍යතා | අදාල නීති රීති, රෙගුලාසි | ලබාදෙන සහන හෝ පැහැර හැරීමේදී දණ්ඩනය | |
|---|---|---|---|---|---|
| | | ගෙවීමට යටත් වේ. | | | |
| 10 | කමර්ාන්ත බද්ද අය කර ගැනීම | අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට නියම කර නොමැති හා භාණ්ඩ හෝ ද්‍රව්‍ය විකිණීමේ කාර්යයක නියුක්ත වන තැනැත්තකු මේ බද්ද ගෙවීමට යටත් වේ | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 150 වන වගන්තිය | | • සිහි කැඳවීමට අනුගත වී නොමැති විට, බද්ද අය කර ගැනීමට මහේස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් ගොනු කිරීම<br>• අය කර ගත යුතු බද්ද දඩයක් වශයෙන් අය කර ගැනීමට නියෝගය නිකුත් කිරීම |
| 11 | පරිසර ආරක්ෂණ බලපත්‍රය | (අ) පළාත් පාලන ආයතන බල ප්‍රදේශය ඇතුළත ඇමුණුම 01 හි සඳහන් කිසියම් කමර්ාන්තයක් ආරම්භ කිරීමට අදහස් කරනු ලබන නැතහොත් එවැනි කමර්ාන්තයක් කර ගෙන යනු ලබන තැනැත්තෙකු විය යුතු ය.<br>(ආ) අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගවලින් කර ඇති නියම සම්පූණර් කර තිබිය යුතු ය | (අ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත;<br>(ආ) මෙහි ඇමුණුම 02 හි ඇතුළත් කර ඇති 2022. 01. 27 වන දිනය දක්වා ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති,එකී පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූනියෝග | - | - |
| 12 | ප්‍රචාරක දැන්වීම් ප්‍රදශර්න අවසර පත්‍ර නිකුත් කිරීම | | යම් කාණ්ඩයක පළාත් පාලන ආයතනයකට ලැබී ඇති බලය යටතේ සාදන ලද හෝ ඒ යටතේ සාදන ලදැයි සලකනු ලබන, ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා | - | - |
| 13 | වරිපනම් අය කිරීම/ | (අ) කිසියම් පළාත් පාලන ආයතනයක වරිපනම් අය කිරීමට යටත් ප්‍රදේශයක පිහිටා ඇති හා එම ආයතනය විසින් තීරණය කරනු ලබනයම් නිශ්චල හෝ නිශ්චල දේපළ වගර්යකට දේපළක් විය යුතු ය.<br>(ආ) එකී යම් දේපළක අයිතිකරු හෝ පදිංචිකරු මෙම වරිපනම් ගෙවීමට යටත් විය යුතු ය. (දේපළෙහි පදිංචිකරු එකී දේපළෙහි අයිතිකරු වුව | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තියෙන් එම ආයතනවලට නියම කර ඇති කාර්ය හා කතර්ව්‍යය කිරීමේ දී හා ඉටු කිරීමේ දී දරනු ලබන වියදම ප්‍රතිපූරණය කර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට වරිපනම් නියම කර අය කර ගැනීමට බලය පැවරී ඇත. | නියමිත දිනට ප්‍රථම ගෙවන්නේ නම් වට්ටමක් හිමිවේ<br>දරිද්‍රතාවයෙන් පෙළෙන්නේ නම් සභා සම්මුතියෙන් නිදහස් කළ හැකිය 113/135 (ඉ) | නියමිත කාලය ඇතුළත එම වරිපනම් ගෙවීමට යම් තැනැත්තකු අපොහොසත් වන්නේ නම්, එම හිඟ මුදල් අය කර ගැනීම සඳහා සභාවේ නිලධරයකුගේ හෝ යම් බදු එකතු කරන්නකුගේ නමට විනිග්‍රහන බලපත්‍රයක් නිකුත් කිරීමට නාගරික කොමසාරිස්ට / ලේකම්ට නීතිමය බලය ඇත.<br>(ආ) නාගරික කොමසාරිස් / ලේකම් විසින් එවැනි බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ විට, එම බලපත්‍රය ලැබූ තැනැත්තා විසින් අදාළ දේපළ මත තිබෙන කවර |

| අ අ | ලබාදෙන සේවය | සපුරාලිය යුතු අවශ්‍යතා | අදාල නීති රීති, රෙගුලාසි | ලබාදෙන සහන හෝ පැහැර හැරීමේදී දණ්ඩනය | |
|---|---|---|---|---|---|
| | | ද නොවුන ද එහි පදිංචිකරු - සභාව විසින් සපයනු ලබන සේවාවෙන් ප්‍රයෝජන ලබන තැනැත්තා - වරිපනම් ගෙවීමට යටත් තැනැත්තා විය යුතු ය) | | | හෝ තැනැත්තකුට අයත් සියලු ම චංචල දේපළ තහනමට ගෙන විකුණා අය විය යුතු මුදල් ප්‍රමාණය අය කර ගෙන පළාත් පාලන ආයතනයේ අරමුදලට තැන්පත් කිරීම ද නීත්‍යානුකූල වේ.<br>(ඇ) මෙසේ කිසියම් චංචල දේපළක් තහනමට ගැනීමට විනිග්‍රහන බලපත්‍රයක් නිකුත් කිරීමේ ගාස්තුව වශයෙන් පහත පරිදි මුදලක් ද අය කර ගැනීමට බලය ඇත.<br>i. වරිපනම් හිඟය අදාළ වන දේපළ නේවාසික ස්ථානයක් හෝ හිස් ඉඩමක් වන විට, අය විය යුතු මුදලෙන් 15% ක ප්‍රමාණයක්; හෝ<br>ii. වරිපනම් හිඟය අදාළ වන දේපළ නේවාසික ස්ථානයක් හෝ හිස් ඉඩමක් නොවන වෙනත් වගර්යක දේපළක් වන විට, අය විය යුතු මුදලෙන් 20% ක ප්‍රමාණයක්.<br>(ඇ) එසේම චංචල දේපළ තහනමට ගැනීමේ ගාස්තු වශයෙන් අය විය යුතු මුදල් ප්‍රමාණයෙන් 10% ක අතිරේක ගාස්තුවකට ද වරිපනම් ගෙවීමට බැඳී සිටින තැනැත්තා යටත් වනු ඇත.<br>(ඉ) තවදුරටත් එසේම, තහනමට ගත හැකි චංචල දේපළ කිසිවක් නොමැති අවස්ථාවක අදාළ නිශ්චල දේපළ තහනමට ගෙන විකිණීමට ද නීතිමය බලය ලැබී ඇත. |
